කැලණිය අධ්‍යාපන කලාපය

දෙවන වාර පරීක්ෂණය - 2017

08 ශ්‍රේණිය | පෙරදිග සංගීතය | කාලය පැය 1½ යි.

නම : ........................................................................................................

## I කොටස

- **1 සිට 20 දක්වා වූ ප්‍රශ්න සඳහා නිවැරදි පිළිතුර තෝරා යටින් ඉරක් අඳින්න.**

01. / ස ග ග / ග ම රි / ග ම ධ / ප - - / යනු බිලාවල් රාගාශ්‍රිත ස්වර ස්ථාපන ගීතයක දෙවන ස්වර පාදයයි. ඊට අදාළ වචන මාලාව වන්නේ,
(i) සිරස නමමු මව් පොළොවට (ii) දෑ අභිමානෙන් අපි
(iii) දිනකර රැස් විහිදුවා (iv) අපි මව්බිම රකිනෙමු

02. බිලාවල් රාගයට ආවේනික වූ ලක්ෂණයකි,
(i) ශුද්ධ ස්වර සියල්ලම යොදා ගැනීම.
(ii) ම , නි යන ස්වර හැර ඉතිරි ශුද්ධ ස්වර පමණක් යොදා ගැනීම.
(iii) ශුද්ධ ස්වරවලට අමතරව කෝමළ ග, නි යන ස්වර ද යොදා ගැනීම.
(iv) ශුද්ධ ස්වර සමඟ කෝමළ ස්වර සියල්ල යොදා ගැනීම.

03. 

අංකනය කරන ලද ස්වර පුවරුවක කොටසක් මෙම රූප සටහනින් දැක්වෙන අතර භූපාලි රාගය වයන විට භාවිතයට නොගන්නා ස්වරයන්ට අයත් අංක හැටියට හැඳින්විය හැක්කේ,
(i) 4 හා 7 (ii) 3 හා 4 (iii) 6 හා 7 (iv) 3 හා 7

04. තබ්ලාවෙන් ඊට අදාළ කිසියම් වූ තාලයක් වාදනය කරනු ලබන විට එම තාලයේ අවනද්ධ පදය හඳුන්වනු ලබන්නේ,
(i) මූල පදය (ii) ඨේකාව (iii) සමග්‍රහය (iv) විභාගය

05. / සු ව ඳ / විහිද / නා S උ / දේ S වි / ලේ S නෙ / ළු මි ම / ලේ S S / S S S /
මෙම ගී පද ප්‍රස්ථාරය සම්බන්ධව නිවැරදි ප්‍රකාශය වන්නේ,
(i) ත්‍රි තාලයේ තාල ආවර්ථ 4 කට අනුව මෙය ප්‍රස්ථාර ගත කර ඇත.
(ii) ඣප් තාලයට අනුව මෙය ප්‍රස්ථාරගත කර ඇත.
(iii) දාදරා තාලයේ තාල ආවර්ථ 4 කට අනුව මෙය ප්‍රස්ථාර ගත කර ඇත.
(iv) දාදරා තාලයේ තාල ආවර්ථ 8 කට අනුව මෙය ප්‍රස්ථාර ගත කර ඇත.

06. තබ්ලාවෙන් වයනු ලබන තාලයන් අත්ලෙන් තාල දමා පෙන්වීමේදී අත්පුඩි නොගසා අත ඉවතට ගෙන පෙන්වනු ලබන ස්ථානය,
(i) සමග්‍රහය (ii) ඛලිය (iii) 2 වන අනුතාල ස්ථානය (iv) 3 වන අනුතාල ස්ථානය

07. ශුද්ධ ස්වර වලින් පමණක් ස්වර ප්‍රස්ථාරය නිර්මාණය වී ඇති ගීත යුගලයකි,
(i) ලංකා ලංකා පෙම්බර ලංකා - ලලිත කලා ඔප කරනා
(ii) නිල් අහස් තලේ අගේ - සරුංගලේ වරල් සැලේ
(iii) ලලිත කලා ඔප කරනා - ඈත එපිට ගම්මානෙන් නැග එන
(iv) සරුංගලේ වරල් සැලේ - මගෙ පුතු හරි හපනා

08. ස්වර පිහිටීම අතින් සමානත්වයක් දක්වන සංගීත භාණ්ඩ යුගලයකි,
(i) වයලීනය - එස්රාජය (ii) එස්රාජය - සර්පිනාව
(iii) සිතාරය - එස්රාජය (iv) සිතාරය - සර්පිනාව

09. ''සිරි සරු සාර කෙතේ ගොයම් පැසීලා මහිමේ''
''ගොයම් පැසීලා කුඹුරේ''
මෙම සරල ගී වලින් කියැවෙන අදහසට වඩාත් සමීප වූ ගැමි ගීයකි,
(i) ඉරු දෙවියෝ වැඩි තැනේ (ii) උදයට පායන හිරු දෙවියන්ටයි
(iii) මේ කොතනින් ගෙනා ගොනා (iv) ඉපල් පිටින් ගහන අව්ව

10. නූර්ති ගීත 02 කි,
(i) මුහුදු පතුල යට ඉඳලා / අන්න බලන් සඳ
(ii) ලෝනා මුණි රාජගේ / අන්න බලන් සඳ
(iii) මුහුදු පතුල යට ඉඳලා / බෝ දොස් කියා මාගෙ
(iv) බෝ දොස් කියා මාගෙ / ලෝනා මුණි රාජගේ

11. නව නාට්‍ය සඳහා ගී පද රචනා කළ හා සංගීතය සැපයූ දෙපලකි,
(i) ජෝන් ද සිල්වා මහතා / චාල්ස් ඩයස් මහතා
(ii) ගුණසේන ගලප්පත්ති මහතා / ලයනල් අල්ගම මහතා
(iii) ලයනල් අල්ගම මහාත / සෝමදාස ඇල්විටිගල මහතා
(iv) මහගම සේකර මහතා / සෝමදාස ඇල්විටිගල මහතා

12. පහත දී ඇති ප්‍රකාශ අතුරින් සත්‍ය වන්නේ,
(i) හේමමාලී නව නාට්‍යයකි. වෙස්සන්තර නූර්තියකි.
(ii) මුහුදු පුත්තු නව නාට්‍යයකි. කුණ්ඩලකේෂී නූර්තියකි.
(iii) මුහුදු පුත්තු නව නාට්‍යයකි. හේමමාලි නූර්තියකි.
(iv) වෙස්සන්තර නව නාට්‍යයකි. කුණ්ඩලකේෂී නව නාට්‍යයකි.

13. ඣප් තාලයට ගැයෙන ගී පද පේලියකි,
(i) ඇසේ මතුවන කඳුළු බිඳුගෙන (ii) රන්වන් කරල් සැලෙයි සන්සුන් කමින් බරව
(iii) සැඳෑ කළුවර කුරගගාවිත් (iv) සිනහවෙන් හෝ කතාවෙන් බෑ මනින්නට මිනිසා

14. / සු ව ඳ / හ ම නා S / සු පි පි / කු සු ම ක /
මෙම පද ප්‍රස්ථාර ගතකර තිබෙන රිද්මයට අනුව පද ප්‍රස්ථාර කළ හැකි ගී පද පේලියකි,
(i) සිරි සාර අති ශාන්ත රමණීය හෙළ දීප
(ii) ඇසේ මතුවන කඳුළු බිඳගෙන
(iii) රන්වන් කරල් සැලෙයි සන්සුන් කමින් බරව
(iv) ලෝකයත් නසනන්ට රුදුරු අවි අත දරා සැරසෙමුද

15. ගීතයක් ගයන විට එහි වචන මාලාවන්ට යටින් එම ගායනය විචිත්‍රවත් වන අයුරින් ගලායන සංගීත කණ්ඩ හඳුන්වන්නේ,

(i) COUNTER (ii) VERSE (iii) BIT (iv) INTRO

16. ගීතයක පදමාලව ගායනය කළ යුතු ආකාරය දැක්වෙන්නේ,

(i) ආරම්භක වාදනයෙනි. (ii) තනුවෙනි. (iii) අතුරු වාදනයෙනි. (iv) රිද්මයෙනි.

17. ඒ.ආර්. රහුමාන් නම් දමිළ සංගීතඥයා විසින් නිර්මාණය කරන ලද ගීතයකි,

(i) රාධේ ගෝවින්ද (ii) ජය ගනේෂ

(iii) පයෝ පී මෛනෙ (iv) චින්න චින ආසෙයි

18. නෙළුම් ගී සම්බන්ධයෙන් කර ඇති වඩාත් නිවැරදි ප්‍රකාශය තෝරන්න.

(i) සරල නාද රටාවලින් යුක්ත ගොයම් කැපීමේදී ගයන මෙහෙ ගී විශේෂයකි.

(ii) අඬහැර පෑම සුවිශේෂීව දක්නට ලැබෙන මෙහෙ ගී විශේෂයකි.

(iii) අඩු ලයකින් ඇද පැද ලෙලවා ගයනු ලබන මෙහෙ ගී විශේෂයකි.

(iv) ගොයම් පෑගීමේදී කමතේදී ගයන මෙහෙගී විශේෂයකි.

19. / බු ද් ධ / ං ස ර / ණේ S S / S S S / සි ර ස / ද රා S / ගෙ න S / S S S /

මෙහි ගිමත් ගණන වනුයේ,

(i) 16 (ii) 24 (iii) 12 (iv) 18

20. බටහිර සංගීතයේ එන සෙමිබ්‍රීව් (0) එකක වටිනාකම සමාන වන්නේ,

(i) මිනිම් 4 කට (ii) ක්‍රොචට්ට් 2 කට (iii) ක්වේවර් 4 කට (iv) මිනිම් 2 කට

## II කොටස

- **පළමු ප්‍රශ්නය අනිවාර්ය වේ. එම ප්‍රශ්නය සහ තවත් ප්‍රශ්න 2 ක් තෝරාගෙන ප්‍රශ්න 3 කට පමණක් පිළිතුරු සපයන්න.**

01.

| රාගය | රාගයට අදාළ තොරතුරු |
|---|---|
| A | * ස්වර සප්තකයේ ඇති ස්වර අතුරින් ශුද්ධ ස්වර පමණක් යොදාගනු ලබන මුත් මධ්‍යමය හා නිශාධය යන ස්වර දෙක යොදා නොගනියි.<br>* ගපධප, ස්ධප වැනි ස්වර සංගති යෙදේ. |
| B | * ස්වර සප්තකයේ ඇති සියළු ශුද්ධ ස්වර මේ සඳහා යොදා ගනු ලබයි.<br>* ගරිගප, මගමරිස වැනි ස්වර සහගති යෙදේ. |

(i) ඉහත A හා B යන රාග දෙක නම් කරන්න. (ලකුණු 04)

(ii) ඉන් ඔබ හොඳින් දන්නා රාගයකට අයත් ස්වර ස්ථාපන ගීතයක ස්ථායී කොටස පමණක් ගීත - ස්වර ප්‍රස්ථාර කර දක්වන්න. (ලකුණු 06)

02.

| ගීතය (1) | ගීතය (2) |
|---|---|
| මල් විසිරිලා වගෙයි<br>තරු දිලෙන ආකාසෙ<br>පුර හඳද පිරිවරා<br>ලස්සනට බබලනා | රැල්ල බිඳිලා වෙරළෙ හැපිලා<br>බුබුළු මතුවෙයි කිරි කවඩි සේ<br>නැගෙයි බැසයයි එක පෙළට මෙන්<br>නොනවතින විලසින් ම සැමදා |

(i) ඉහත (1) හා (2) යන ගීතයන් ගැයීමට උචිත හින්දුස්ථානී තාලයන් නම් කරන්න. (ලකුණු 02)

(ii) ඉන් ඔබ කැමති ගීයක් තෝරාගෙන එය එම තාලයට අනුව ප්‍රස්ථාර ගත කරන්න. (ලකුණු 04)

(iii) එම තාල දෙකෙන් එකක් තෝරාගෙන එය නිවැරදිව ප්‍රස්ථාර ගත කරන්න. (ලකුණු 04)

03. (i) පහත දී ඇති ලක්ෂණ හොඳින් අධ්‍යයනය කොට ඉන් ගැමි ගීවල අදාළ ලක්ෂණ පමණක් වෙන් කොට ලියා දක්වන්න.

* සරල ගැමි බස් වහරකින් යුක්ත වේ.
* නාද මාලාවන් හා රිද්ම රටා සරල බවින් යුක්තයි.
* වියත් බසකින් රචනා වී ඇත.
* මුඛ පරම්පරාවෙන් පැවත ඒ.
* උගත් පඬිවරුන් විසින් රචනා කොට ඇත.
* ජීවන වෘත්තීන් හා බැඳී පවතින අයුරින් නිර්මාණය වී ඇති ගීත ද දක්නට ඇති අතර ඒවා මෙහෙ ගී වශයෙන් නම් කරයි. (ලකුණු 04)

(ii) ඉහත ඔබ විසින් ලියා දක්වන ලද ලක්ෂණ දක්නට ලැබෙන ගැමි ගී විශේෂ 03 ක් නම් කරන්න. (ලකුණු 03)

(iii) එම එක් එක් ගී විශේෂ සඳහා නිදසුන බැගින් ලියන්න.
(මුල් ගී පාදය පමණක් ලිවීම ප්‍රමාණවත් වේ.) (ලකුණු 03)

04.
* ලෝනා මුණි රාජගේ
* අම්බරයේ සඳසේ දිළී
* මුහුදු පතුල යට ඉඳලා
* අපි ගමට යමු
* බෝ දොස් කියා මාගෙ
* අන්න ඉලන් සඳ රන් තැටියෙන් සුදු

(i) ඉහත ගීත ලයිස්තුවට අදාළ ගීත පමණක් උපයෝගී කොටගෙන පහත ඇති වගුව සම්පූර්ණ කරන්න. (ලකුණු 06)

| නූර්ති ගී | නාඩගම් ගී | නව නාට්‍ය ගී |
|---|---|---|
| | | |

(ii) නූර්ති හා නාඩගම් ගී වල දක්නට ලැබුණු සංගීතමය ලක්ෂණ 02 බැගින් ලියා දක්වන්න. (ලකුණු 04)